OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL OUSL

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

**මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### 01) වැඩමූලික (පොත් බැඳුම්) පහළ ශ්‍රේණිය [U-MT 1(II)]

සුදුසුකම් : අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වීම හා මුද්‍රණාලයක පොත් බැඳුම් අංශයේ පොත් බැඳීම පිළිබඳ වසර දහයකට (10) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

බඳවා ගැනීම : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### 02) තාක්ෂණික නිලධාරී (ශ්‍රව්‍ය දෘශ්‍ය) III ශ්‍රේණිය [U-MT 1(III)]

සුදුසුකම් :(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එක් වරක දී විෂයයන් තුනකින් සමත්ව තිබීම.

සහ

(ii)(අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් පිළිගත් ආයතනයකින් හෝ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකින්

හෝ

ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉලෙක්ට්‍රොනික/බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාළව, ජාතික වෘත්තීය නිපුනතා (National Vocational Qualification) 5 වෙනි මට්ටමට (NVQ Level 5) නොඅඩු නිපුනතා සහතිකපත්‍රයක් ලබා තිබීම.

හෝ

(ආ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ඉහත (ii) (අ)කොටසෙහි සුදුසුකම්වලට සමාන සුදුසුකමක් ලෙස පිළිගත් ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉලෙක්ට්‍රොනික/බහු මාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික ක්‍රම යන ක්ෂේත්‍රයකට අදාළව ලබා ගත් තාක්ෂණික සුදුසුකම් සමඟ පිළිගත් ආයතනයකින් ලබාගත් ශ්‍රව්‍ය දෘශ්‍ය කටයුතු පිළිබඳ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

බඳවා ගැනීම :ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### 03) සැලසුම්කරු (පහළ ශ්‍රේණිය) [U-MT 1(III)]

සුදුසුකම් :රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක සැලසුම්කරණය පිළිබඳ විභාගයක දී සැලසුම්කරුවෙකු ලෙස සුදුසුකම් ලබා තිබීම

බඳවා ගැනීම : සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### 04) පරිපාලක (විදුලි) III ශ්‍රේණිය [U-MT 1(III)]

සුදුසුකම් :1. තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය හෝ සමාන සුදුසුකමක් සමඟ වසර තුනක (03) පළපුරුද්දක් තිබීම. (අදාළ පළපුරුද්ද පාඨමාලා හදාරන ලද කාලය තුළදී ලබා තිබීම ප්‍රමාණවත් වේ)

හෝ

2. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත්වීම හා රාජ්‍ය/පළාත් පාලන ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ පරීක්ෂකවරයකු ලෙස වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

බඳවා ගැනීම : සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### 05) හෙද නිලධාරි ( II ශ්‍රේණිය) [U-MT 1(III)]

සුදුසුකම් : 1. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) සමත් විය යුතුය.

සහ

2. රජයේ වෛද්‍ය මණ්ඩලය විසින් පිළිගත් හෙද සහතිකයක් ලබා තිබීම

බඳවා ගැනීම : සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### 06) මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය) [U-MT 1(III)]

සුදුසුකම් : සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගයෙන් සමත්වීම.

බඳවා ගැනීම : සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### 07) විදුලි කාර්මික (III ශ්‍රේණිය) [U-PL 3(III)]

### 08) වැද්දුම්කරු (III ශ්‍රේණිය) [U-PL 3(III)]

### 09) යන්ත්‍ර ශිල්පී (III ශ්‍රේණිය) [U-PL 3(III)]

ඉහත අංක 07, 08 සහ 09 තනතුරු සඳහා

සුදුසුකම් :ඉහත එක් එක් තනතුරුවල කාර්යයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. [පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.]

බඳවා ගැනීම : වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### 10) රියදුරු (III ශ්‍රේණිය) [U-PL 3(III)]

සුදුසුකම් : 1. අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත් වී තිබීම.

සහ

2. බර වාහන පැදවීම සම්බන්ධව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද රියදුරු බලපත්‍රයක් තිබිය යුතු අතර රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව යටත් පිරිසෙයින් වසර තුනක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

බඳවා ගැනීම : වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### 11) නිවාස භාරකරු සහ අරක්කැමි (III ශ්‍රේණිය) [U-PL 2(III)]

සුදුසුකම් : 1.අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ තනතුරට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. [පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් නිකුත් කරන සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කළ යුතුය.]

හෝ

2.අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ කාර්මික කුසලතා සමඟ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

බඳවා ගැනීම : වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### 12) පූර්ණ කාලීන උප ශාලාධිපති II ශ්‍රේණිය (කාන්තා) [U-MN 3(II)]

සුදුසුකම් : පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධරයෙකු විය යුතුය. නේවාසිකාගාර පරිපාලන හා කළමණාකරණය පිළිබඳව පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

බඳවා ගැනීම : සම්මුඛ පරීක්ෂණයක් මඟින්

### 13) ආරක්ෂක සේවක (III ශ්‍රේණිය) [U- PL 1(III)]

සුදුසුකම් : අ.පො.ස. (සා.පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සමත් වී තිබීම.

බඳවා ගැනීම : වෘත්තීය පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**ඉහත අංක 01 සිට 13 දක්වා තනතුරු සඳහා**

වයස : අවුරුදු 18 ට නොඅඩු සහ **45 ට නොවැඩි** විය යුතුයි.

### 14) කළමනාකරණ සහකාර (පොත් තැබීම) III ශ්‍රේණිය [U-MN 1(III)]

### 15) කළමනාකරණ සහකාර (ගබඩා පාලන) III ශ්‍රේණිය [U-MN 1(III)]

ඉහත අංක 14 සහ 15 තනතුරු සඳහා

පොදු සුදුසුකම් : 1. අ.පො.ස. (සා.පෙළ) විභාගය සිංහල භාෂාව/දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් (06) එක්වරක දී සමත් වී තිබීම.

සහ

2. අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

සටහන : 1. පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් සහ පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පලපුරුද්ද ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

2. විශ්වවිද්‍යාලය විසින් නිශ්චය කරනු ලබන පරිදි තෝරා ගනු ලබන අයදුම්කරුවන් විසින් ආරක්ෂණ තැන්පතුවක් තැබිය යුතුය.

ඉහත පොදු සුදුසුකම්වලට අමතරව පහත සඳහන් විශේෂිත සුදුසුකම් ද සපුරාලිය යුතු වේ.

**කළමනාකරණ සහකාර (පොත් තැබීම) III ශ්‍රේණිය තනතුර සඳහා**

විශේෂිත සුදුසුකම් : i. නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාලයකින් හෝ තාක්ෂණ විද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණ ශිල්පය පිළිබඳ ජාතික සහතික පත්‍රය හෝ පිළිගත් ආයතනයකින් පිරිනමනු ලබන ඒ හා සමාන සුදුසුකමක්

හෝ

ii. අ.පො.ස. (උ.පෙළ) විභාගය වානිජ්‍ය විෂයය ධාරාවෙන් එක් වරක දී සියලු විෂයයන් සමත් වීම.

**කළමනාකරණ සහකාර (ගබඩා පාලන) III ශ්‍රේණිය තනතුර සඳහා**

විශේෂිත සුදුසුකම් : ගබඩාකරණය පිළිබඳ වසරක පළපුරුද්ද සහිතව අ.පො.ස. (සා.පෙළ.) විභාගයේ වානිජ්‍ය විෂයය සමත්වීම හෝ අ.පො.ස. (උ.පෙළ.) විභාගයේ ගිණුම්කරණය විෂයය සමත්වීම.

බඳවා ගැනීම : ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්

වයස : අවුරුදු 18 ට නොඅඩු සහ **30 ට නොවැඩි** විය යුතුයි.

එක් එක් තනතුරට අදාළ වැටුප් පරිමාණයන් :-

| | |
|---|---|
| U-MN 3 (II) | - රු. 71,365 - 18 X 1,190 – 92,785 (මාසික) |
| U-MT 1 (II) | - රු. 57,435 - 7 X 640; 9 X 890 – 69,925 (මාසික) |
| U-MT 1(III) | - රු. 51,095 - 7 X 540; 10 X 640 – 60,575 (මාසික) |
| U-MN 1(III) | - රු. 49,475 - 17 X 540 – 58,655 (මාසික) |
| U-PL 3(III) | - රු. 48,005 - 16 X 490 – 55,845 (මාසික) |
| U-PL 2(III) | - රු. 44,575 - 16 X 490 – 52,415 (මාසික) |
| U-PL 1(III) | - රු. 42,775 - 16 X 450 – 49,975 (මාසික) |

මෙම තනතුරු සඳහා මූලික වැටුපට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

අයදුම්පත් https://ou.ac.lk යන විශ්වවිද්‍යාලයේ නිල වෙබ් අඩවියෙන් (https://ou.ac.lk/staff-resources/ හි Establishment Division යටතේ ඇති Application Non-academic හෝ මෙම විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන ආයතන අංශයට පැමිණ ලබා ගත හැකිය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ යන ලිපිනයට **2025.11.21** දින හෝ එදිනට පෙර **ලැබෙන සේ** එවිය යුතුය.

රාජ්‍ය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය. අයදුම්පත් සමඟ සහතිකවල ඡායා පිටපත් ද අමුණා එවිය යුතුය. **ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

**අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපහැදිලි බව, සහතිකවල ඡායා පිටපත් අමුණා නොතිබීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.** කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ

2025.11.02